# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2034/34 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(XII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23 ද වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කටයුතු තහනම් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා පොලිතින් අමු ද්‍රව්‍යයක් වන ආහාර දවටන නිපදවීම ; සහ

(ii) පොලිතින් අමුද්‍රව්‍යයක් ලෙස යොද නිෂ්පාදිත ආහාර දවටන රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලයේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මේ නියමයේ කාර්යය සඳහා-

''ආහාර දවටන'' යන්නෙන්, ලන්ච් ශීට් අදහස් වේ.

''පොලිතින් '' යන්නට, වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලින්, අඩු ඝනත්වයෙන් යුත් පොලිඑතිලින් සහ පොලිප්‍රොපිලින් ද ඇතුළත් වේ.

09-362

1A - PG 3677 — 5007 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*